# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1771/24 - 2012 අගෝස්තු මස 17 වැනි සිකුරාදා - 2012.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංක : 4625

විශේෂ අංකය : නු/44

### 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යාවස්ථාපිත නිශ්චය

රිකිල්ලගස්කඩ රිකිල්ලගස්කඩ වත්තෙහි පිහිටි සී/ස කුමාරගේ වතු සමාගමට අයත් ඉඩම් සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂවරියක් විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින් පනතේ 8 වැනි වගන්තිය අනුව ඇග්නස් මාගරිටා නැනියෙල් ද සොයිසා මහත්මිය පමණක් උපරිමයට වැඩි ඉඩම් ප්‍රමාණයක් හිමි තැනැත්තියක් වූයෙන් මේ වන විට ඇය මියගොස් ඇති බැවින් පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කාරියට අයත්ව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඇයට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස නිශ්චය කරමින් ඇයගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කාරියට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයේ දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2012 අගෝස්තු මස 17 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07,

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියතිලක කෝරළේ සුළු කොට්ඨාසයේ රිකිල්ලගස්කඩ අංක 492ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රිකිල්ලගස්කඩ සහ වලලවලගම යන ගම්වල පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක නු/2771හි දැක්වෙන රිකිල්ලගස්කඩ වත්ත නමැති ඉඩමේ අක්කර හතලිස් නවයයි රූඩ් එකයි පර්චස් තිස් පහයි දශම හතයි හතරක (අ. 49, රූ. 1, පර්. 35.74) (හෙක්ටයාර් 20.0216) ප්‍රමාණය ඇති කැබලි අංක 02, 04, 06, 07, 10, 11, 13. 14, 16 සහ 24 දරන බිම් කොටස් සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

08-932

1A - G 16450— 340 (2012/8)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.